1979 අප්‍රේ 20

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 20 දරන
# වෙඩි කඳවුරු සහ යුද්ධ හමුද පුහුණුවීම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 25 යි

1979 අංක 20 දරන වෙඩි කඳවුරු සහ යුද්ධ හමුදා පුහුණුවීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 63/77.

**වෙඩි කඳවුරු සහ යුද්ධ හමුදා පුහුණුවීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1979 අංක 20 දරන වෙඩි කඳවුරු සහ යුද්ධ හමුදා පුහුණුවීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

363 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. වෙඩි කඳවුරු සහ යුද්ධ හමුදා පුහුණුවීම් පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (2) (අ) ශ්‍රී ලංකාව නොවන යම් රටක යම් නාවික, යුද්ධ හෝ ගුවන් හමුදාවක් විසින් අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙඩි තැබීම් පුහුණු වීම සඳහා එසේ නියම කරනු ලබන යම් කාලසීමාවක් තුළ හා එසේ නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව යම් වෙඩි කඳවුරක් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(ආ) ශ්‍රී ලංකා පොලිස් හමුදාවේ හෝ ශ්‍රී ලංකා රයිෆල් සංගම යක යම් සාමාජිකයකු විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, ඒ ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙඩි තැබීම් පුහුණුවීම සඳහා එසේ නියම කරනු ලබන යම් කාලසීමාවක් තුළ හා එසේ නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව යම් වෙඩි කඳවුරක් පාවිච්චි කරනු ලැබිය හැකි ය.".

ඒ 39999—12,300 (79/02)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.